(15) ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත්වූයේ මීට අවුරුදු කීයකට පෙරදී ද?

(1) අවුරුදු දෙදහස් පන්සියයකට පෙර ය.

(2) අවුරුදු තිස්දාහකට පෙර ය.

(3) අවුරුදු විසිපන්දාහකට පෙර ය.

(4) අවුරුදු එක්ලක්ෂ විසිපන්දාහකට පෙර ය.

(16) ප්‍රාග් ඓතිහාසික යුගය යනුවෙන් පොදුවේ හැඳින්වෙන්නේ,

(1) ක්‍රිස්තු පූර්ව පස්වන සියවසට පෙර යුගයයි.

(2) ස්ථිර ජනාවාස සාදා ගැනීම ආරම්භ වූ කාල වකවානුවයි.

(3) ලිඛිත ඉතිහාසය ආරම්භ වීමට පෙර යුගයයි.

(4) සාහිත්‍ය මූලාශ්‍රය මගින් විස්තර කෙරෙන අතීත කාලයයි.

(17) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මළසිරුරු නවා වකුටු කර වළලන අභිචාර විධියක් අනුගමනය කළ බවට සාක්ෂි හමුවී ඇත්තේ,

(1) රාවණා ඇල්ල ගල් ගුහාවෙනි.

(2) පාහියන්ගල ගල් ගුහාවෙනි.

(3) කුරුවිට බටදොඹ ලෙනෙනි.

(4) ඉබ්බන්කටුවෙනි

(18) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ තාක්ෂණය ගැන දැන ගැනීමට ඉවහල් වන එකම සාධකය පහත කුමක් ද?

(1) ගල්මෙවලම් ය.

(2) නටබුන් ය.

(3) වාපී ග්‍රාම ය.

(4) ලෝහ උපකරණය

(19) ක්‍රිස්තු පූර්ව 700 - 450 අතර කාලවකවානුවට අයත් ඉබ්බන්කටුව සුසාන භූමියේ පුරාවිද්‍යාත්මක කැනීම්වලින් සොයා ගන්නා ලද ගෙලමාලය සඳහා පබළු ආනයනය කර ඇත්තේ පහත කුමන රටකින් ද?

(1) අරාබියෙනි.

(2) රෝමයෙනි.

(3) ඉන්දියාවෙනි.

(4) පර්සියාවෙනි.

(20) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් බුන්දල වැල්ලේගංගොඩ ප්‍රදේශයේ පොළොව මතුපිට අඩි 24ක් යටින් පිහිටි ගල් මෙවලම් සහිත බොරළු තට්ටුව කාල නිර්ණය අනුව වසර කීයකට වඩා පැරණිදැයි තහවුරු වී ඇත් ද?

(1) වසර එක්ලක්ෂ විසිපන්දාහකට

(2) වසර තිස් අට දාහකට

(3) වසර අසූ දාහකට

(4) වසර විසි අට දාහකට

පහත වගුවේ සඳහන් A සිට J දක්වා තොරතුරු ඇසුරින් 21 සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| පරිසර කලාපය | වාසස්ථාන | සොයා ගත් සාක්ෂි |
|---|---|---|
| A. පහතරට තෙත් කලාපය | D. බණ්ඩාරවෙල | G. වර්ග මීටර් 150 වන එළිමහන් අඩයම් වාසස්ථානයක |
| B. කඳුකර වියළි අතරමැදි කලාපය | E. කිතුල්ගල බෙලිලෙන | H. අවධි කිහිපයකට අයත් පුද්ගලයන් 9 දෙනෙකුගේ ඇටසැකිලි |
| C. පහතරට වියළි කලාපය | F. සීගිරියේ පොතාන | J. පුළුස්සා ආහාරයට ගත් කැලෑ කෙසෙල් ඇට |

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන සාහිත්‍ය මූලාශ්‍රය වර්ග කිහිපයක් පහත දැක්වේ. ඒවාට උදාහරණ එක බැගින් ලියා දක්වන්න.

A - සන්දේශ කාව්‍ය

B - ප්‍රශස්ති කාව්‍ය

C - හටන් කවි (ලකුණු 03)

(ii) දේශීය හා විදේශීය කාසි වර්ග ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 05)

(iv) "ශ්‍රී ලංකාවේ පැරණි පුරාවස්තු විවිධ මානව ක්‍රියාකාරකම් නිසා හානියට පත්වෙමින් පවතී." එවැනි අවස්ථා තුනකට උදාහරණ දෙමින්, ඒවා රැකගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) පහත A, B, C හි සඳහන් ගල්ගුහා හා එළිමහන් වාසස්ථාන ඇති පරිසර ප්‍රදේශ පිළිවෙලින් නම් කරන්න.

A. බූන්දල

B. බෙල්ලන්බැඳිපැලැස්ස

C. හෝර්ටන්තැන්න (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරය සඳහා ගත් ශාක ආහාර වර්ග දෙකක් සහ සත්ත්ව ආහාර වර්ග දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) (a) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජනාවාසවල ලක්ෂණ දෙකක් ලියන්න.

(b) එම යුගයේ ජීවත්වූවන් ගල් මෙවලම් භාවිත කර කරන ලද කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 05)

(iv) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි උදාහරණ තුනක්වත් දෙමින් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) පූර්ව ඓතිහාසික යුගය ලෙස හැඳින්වූයේ කුමන කාල පරිච්ඡේදයකටදැයි ලියන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි පිහිටි ස්ථාන හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ දියුණු තාක්ෂණයක් තිබූ බව කරුණු දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය පිළිබඳව කරුණු තුනක් ලියා විස්තර කරන්න. (ලකුණු 06)

(21) [illegible] හා [illegible] හා එයින් සොයාගත් සාක්ෂියක් [illegible]
[illegible] ද?

(1) C හා H (2) B හා G (3) A හා H (4) A හා J

(22) [illegible] ආදි කලාපය හා සම්බන්ධ වාසස්ථානයක් හා සොයාගත් සාක්ෂියක් නිවැරදිව
[illegible] ඇති පිළිතුර තෝරන්න.

(1) D හා H (2) D හා G (3) F හා G (4) E හා H

(23) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් වැදගත් සිදුවීමක් වන්නේ,

(1) ගල් ආයුධ භාවිත කිරීම ය.
(2) සංචාරක ජීවිතයක් ගත කිරීම ය.
(3) මැටි බඳුන් නිපදවීම ය
(4) සතුන් පුළුස්සා ගෙන ආහාරයට ගැනීම ය.

(24) මුල් ඓතිහාසික යුගයේ විශාල නාගරික ජනාවාස හැඳින්වීමට "පුර" යන පදය ව්‍යවහාර වී ඇත. පනාකඩුව තඹ සන්නසේ "නුරුපුර" යනුවෙන් හඳුන්වා ඇති පැරණි නගරය වන්නේ,

(1) අනුරාධපුරය
(2) පොළොන්නරුව
(3) මාගම
(4) තිස්සමහාරාමය

(25) කාන්තාවන්ගේ ඇස් අඳුන් නැබීමට භාවිතා කරන ලද ලෝහ කූරක් හමුවී ඇත්තේ,

(1) රංචාමඩමෙනි
(2) රාවණා ඇල්ලෙනි
(3) ඉබ්බන්කටුවෙනි
(4) උඩ රංචාමඩමෙනි.

(26) මෙරට මුල් ඓතිහාසික යුගයේ මූලික ජනාවාස පැතිරෙන්නේ ගංගා නිම්නවල නොව ඊට පිටතින් පිහිටි ප්‍රදේශවල වීමට බලපෑ ප්‍රධාන ම හේතුව ලෙස සැලකෙන්නේ පහත කුමන පිළිතුර ද?

(1) ඔවුන්ගේ ජල අවශ්‍යතා ඇළ මාර්ගවලින් ලැබීම
(2) වාසස්ථාන වූ ගල්ගුහා ගංගා නිම්නවලින් පිටත පිහිටා තිබීම
(3) ස්වාභාවික සම්පත් බහුල ප්‍රදේශ කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කිරීම
(4) ගංවතුර පාලනය කිරීමට තරම් තාක්ෂණික දැනුමක් නොතිබීම

(27) තිස්සමහාරාම වැව ඉදිකළ රජතුමා පහත පිළිතුරු අතුරින් තෝරන්න.

(1) දුටුගැමුණු
(2) ඉළනාග
(3) මහානාග
(4) කාවන්තිස්ස

(28) ක්‍රිස්තු පූර්ව 250 තරම් ඈත කාලයක දී රචිත බ්‍රාහ්මී සෙල්ලිපියක "පුරකමත" යනුවෙන් තනතුරු නාමයක් සඳහන් වේ. එයින් අදහස් කර ඇත්තේ,

(1) නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා ය.
(2) විශාල නාගරික ජනාවාසයයි.
(3) නගරයේ ප්‍රධාන ආරක්ෂකයා ය.
(4) පුරයත්, නගරයත් අතර ඇති ප්‍රදේශයයි.

(05) (i) පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ රජවරුන් කවුරුන්දැයි A, B, C අනුපිළිවෙළින් ලියන්න.

A. තම සොහොයුරිය පාණ්ඩ්‍ය කුමරෙකුට විවාහ කර දුන් රජතුමා

B. මාමාවරුන් සමඟ සටන් කර අනුරාධපුරය පාලන මධ්‍යස්ථානය කරගත් රජතුමා

C. කාසි අච්චු ගැසීම භාරව කටයුතු කළ නිලධාරියා (ලකුණු 03)

(ii) සෙල්ලිපිවල සඳහන් වූ පහත නම් වර්තමානයේ හඳුනාගෙන ඇත්තේ කවුරුන් ලෙසදැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - නගරගුතික

B - පත අදෙක

C - කනපෙඩික

D - කොතුරුගැනා (ලකුණු 04)

(iii) (a) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාර දෙක ලියන්න.

(b) වසභ රජතුමාගෙන් ඉටුවූ කාර්යයන් තුනක් නම් කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස මහා විජයබාහු රජුගේ වැදගත්කම කරුණු තුනක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 06)

(06) (i) පහත රාජ්‍යත්ව සංකල්ප ආරෝපණය කරගෙන තමා හඳුනාගත් රජවරුන් A, B, C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. අලකපය මහරජ

B. චක්‍රවර්ති

C. නරේශ්වර (ලකුණු 03)

(ii) අතීතයේ ජාත්‍යන්තර වෙළෙඳුන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) වැව්ප්‍රපනනය ඉදිකිරීම තුළින් පැරැන්නන් බලාපොරොත්තු වූ අරමුණු දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දුටුගැමුණු රජතුමා මෙරට දේශපාලන බලය නිසි අයුරින් සංවිධානය කිරීමට ගත් උත්සාහයක් කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(29) ඇල්ලේවල කඩදිය පොකුණ සෙල්ලිපියක සඳහන් කර තිබෙන්නේ එම විහාරයට දානය සපයා ගැනීමේ දී යම් ගැටලුවක් ඇති වුවහොත් දසගම් ඇත්තන් රැස්වී එම ගැටලුව විසඳාගත යුතු බවයි. මෙයින් අපට වඩාත් පැහැදිලි වන්නේ,

(1) දසගම් ඇත්තන්ට විහාරයේ ද යම් බලයක් තිබූ බව ය.
(2) ගම් ප්‍රධානීන් දසදෙනෙකුගෙන් දසගම් ඇත්තන් ඇතිවූ බව ය.
(3) ඉතා පුරාණ කාලයක සිට සාමූහිකව ජීවත් වීමත් ලෙසත් සිය ජීවිත හැඩගස්වා ගත් බව ය.
(4) විහාරයට දානය නොලැබුණු විට දසගම් ඇත්තන්ගේ ප්‍රධානත්වයෙන් දානය සකස් කළ බවය.

(30) වැටකින් ආරක්ෂා කර ඇති ගම් අතීතයේ හඳුන්වා ඇත්තේ පහත කුමන නමකින් ද?

(1) වාපීගාම නමිනි.
(2) පරික්ඛිත ගම් නමිනි.
(3) අපරික්ඛිත ගම් නමිනි.
(4) ඵලගම් නමිනි.

(31) පහත ප්‍රකාශ සලකන්න.

- ගමේ වැව් නඩත්තු කිරීම
- වැවෙන් ජලය බෙදා හැරීම
- ගමේ පොදු කටයුතුවල දී නායකත්වය දීම

ඉහත කාර්යයන් සඳහා නායකත්වය දුන්නේ කවුරුන් ද?

(1) පරුමක
(2) ගෘහපති
(3) ගමික
(4) රජ

(32) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත්වූ නිලධාරී තන්ත්‍රයේ ව්‍යුහය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) මිපුරුමුකා, මහමත, බතගු, නගරගුතික
(2) මිපුරුමුකා, සෙනපති, බතගු, අමෙත
(3) මහරජ, මහමත, සෙනපති, බඩගරික
(4) මහරජ, මහලැකති, නගරගුතික, බඩගරික

(33) අනුරාධපුර යුගයේ වසභ රජුගේ සමයේ මධ්‍යම රජයේ නියෝජිතයින් ප්‍රත්‍යන්ත ප්‍රදේශ පාලනයට ඇමතිවරුන් යොදවා තිබූ බව සඳහන් වන මූලාශ්‍රය කුමක් ද?

(1) පනාකඩුව තඹ සන්නස
(2) සිතුල්පව්ව සෙල්ලිපිය
(3) කඩදිය පොකුණ සෙල්ලිපිය
(4) වල්ලිපුරම් රන්පත

(34) පැරණි ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන්වන පරිදි විවිධ වෘත්තිකයන් හා ඔවුන් ජීවත් වූ ගම I හා II තීරුවල දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. කුම්භකාර ගාම | A - මැණික් ගැරූ අය |
| 2. ගෝපාලගාම | B - වළං සාදන්නන් |
| 3. මණිකාරගාම | C - ගොවියන් |
| 4. කසිකාරගාම | D - ගොපල්ලන් |

(1) CDAC
(2) CBDA
(3) DABC
(4) CDAB

(35) පැරණි සෙල්ලිපිවල ගම්වල ජීවත්වූ ගම් ප්‍රධානීන් හඳුන්වා ඇත්තේ,

(1) පරුමක ලෙස ය.
(2) ගමික ලෙස ය.
(3) ගෘහපති ලෙස ය.
(4) මිපුරුමුකා ලෙස ය.

10-F
I·C

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**පළමුවාර අවසාන ඇගයීම - 2018**
**First term End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහිද ලකුණු කර නම් කරන්න.

(i) මාතොට, මිහිතාගල්කන්ද, කිරිදිඔය, අනුරාධපුරය, සීගිරිය, පොළොන්නරුව, කැලණි ගඟ, රංචාමඩම, පොම්පරිප්පු, මහනුවර, යාන්ඔය, පාහියන්ගල (ලකුණු 12)

(ii) චීනය, ඉන්දියාව, රතුමුහුද, ග්‍රීසිය, රෝමය, අරාබිය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ නිවැරදි පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මෙරට පාලනය කළ පළමු ලම්බකර්ණ රජතුමා

B - සමන්තපාසාදිකාව රචනා කරන ලද්දේ

C - රෝමයෙන් රතු පබළු ගෙන්වා රුවන්වැලිසෑයට මහා පූජාවක් කළ රජතුමා

D - ඓතිහාසික මූලාශ්‍රයවල වෙළෙඳගම් හඳුන්වා ඇත්තේ, (ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.




A රූපය

(ii) (1) A රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

(2) මොහු කුමන ජාතිකයෙක් ද?

(3) ජීවත් වූයේ කොහේ ද?

(4) මොහු විසින් රචනා කරන ලද කෘතියක් නම් කරන්න. (ලකුණු 04)



B රූපය

(iii) (1) B වලින් දැක්වෙන පින්තූරය නම් කරන්න.

(2) එය සොයාගන්නා ලද්දේ කොහෙන් ද?

(3) මෙමගින් කිනම් තාක්ෂණයක් පිළිබිඹු වන්නේ ද?

(4) දින නිර්ණය කර ඇත්තේ කෙසේ ද? (ලකුණු 04)

(07) පහත "අ" තීරුව හා "ආ" තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. පිලිප්පස් බැල්ඩියස් | A - ග්‍රීක |
| 2. ඉබන් බතුතා | B - පෘතුගීසි |
| 3. ඔනෙසික්‍රිටස් | C - ඕලන්ද |
| 4. ක්වෙරෝස් පියතුමා | D - අරාබි |

(1) CBDA (2) BADC (3) CADB (4) CDAB

(08) භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම වැනි දේ වාර්තාකර තැබීමට මෙරට ලියා ඇති පැරණිතම ශිලා ලේඛන වර්ගය පහත කුමන නමකින් හැඳින්වේ ද?

(1) ගිරි ලිපි (2) බ්‍රාහ්මීය ලිපි (3) පුවරු ලිපි (4) ආසන ලිපි

(09) තමන් විසින් නොදුටු එහෙත් වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත ලංකාව පිළිබඳ වාර්තා තැබූ කතුවරුන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඇරිස්ටෝටල්, ප්ලිනි, මෙගස්තිනිස් (2) පාහියන් හිමි, හියුංසියැං හිමි, ටොලමි

(3) ඉබන් බතුතා, රොබට් නොක්ස්, ප්ලිනි (4) ඇරිස්ටෝටල්, ඉබන් බතුතා, රිබේයිරෝ

(10) ශ්‍රී ලංකාවේ සාහිත්‍ය මූලාශ්‍රය අනුව වඩාත් පැරණිතම කෘතිය වන දීපවංසය රචනා කරන ලද්දේ කුමන කාලවකවානුවකදී ද?

(1) ක්‍රි.ව. 2වන සියවසේ දී ය. (2) ක්‍රි. ව. 3වන සියවසේ දී ය.

(3) ක්‍රි. ව. 4වන සියවසේ දී ය. (4) ක්‍රි. ව. 5වන සියවසේ දී ය.

(11) පුරාණ සංදේශ කාව්‍ය ලිවීම ආරම්භ වූයේ පහත කිනම් යුගයකදැයි තෝරන්න.

(1) මහනුවර (2) දඹදෙණිය (3) ගම්පොළ (4) කෝට්ටේ

(12) දීර්ඝතම සෙල්ලිපිය වන ගල්පොත සෙල්ලිපිය කරවන ලද රජතුමා වන්නේ,

(1) මහා පරාක්‍රමබාහු (2) නිශ්ශංකමල්ල

(3) වසභ (4) මහා විජයබාහු

(13) අනුරාධපුරයේ ඉසුරුමුණි විහාරයේ පිහිටි අශ්ව හිස හා මිනිසා දැක්වෙන මූර්තියෙන් පහත කුමන දෙවිවරුන් නිරූපණය වන්නේදැයි විශ්වාස කෙරේ ද?

(1) අග්නි හා පර්ජන්‍ය (2) පර්ජන්‍ය හා විෂ්ණු

(3) විෂ්ණු හා ශිව (4) විෂ්ණු හා අග්නි

(14) විවිධ බාහිර බලපෑම්වලට නතුවුව ද ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ අනන්‍යතාවයක් ගොඩ නගා ගැනීමට හැකිවී ඇත්තේ,

(1) දූපතක් ලෙස පිහිටා තිබීමයි.

(2) ඉන්දියාවට දකුණින් හා සමීපව පිහිටීමයි.

(3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීමයි.

(4) පෙර අපර දෙදිග වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස පිහිටීම ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**පළමුවාර අවසාන ඇගයීම - 2018**
**First term End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 10 | ඉතිහාසය | I | පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) මහාවංසයේ පළමු කොටස ලියා ඇත්තේ පහත කුමන රාජ්‍ය සමයේ අවසානය දක්වාදැයි තෝරන්න.
(1) දේවානම්පියතිස්ස රජ
(2) දුටුගැමුණු රජ
(3) මහාපරාක්‍රමබාහු රජ
(4) මහසෙන් රජ

(02) මහානාම හිමියන් විසින් රචිත මහාවංසයට ලියන ලද ටීකාව ලෙස සැලකෙනුයේ මින් කවරක් ද?
(1) ජාතකට්ඨ කථාව
(2) වංසත්ථප්පකාසිනී
(3) උත්තර විහාරට්ඨකථා
(4) විනයට්ඨ කථා

(03) ශ්‍රී ලංකාවේ ශාසනික ඉතිහාසය පිළිබඳව ලියවී ඇති සාහිත්‍ය මූලාශ්‍රය පහත පිළිතුරු අතුරෙන් තෝරන්න.
(1) නිකාය සංග්‍රහය
(2) රාජාවලිය
(3) සද්ධර්මාලංකාරය
(4) සද්ධර්මරත්නාවලිය

(04) පුරාණ කාලයට අයත් සාහිත්‍ය ආගමික තොරතුරු හා වංශ කථා ලියවී ඇත්තේ,
(1) පුස්කොළ පොත්වල ය.
(2) රන් සහ තඹතහඩුවල ය.
(3) මැටි පුවරුවල ය.
(4) ගල්පුවරුවල ය.

(05) පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව, තාක්ෂණය හා පරිසර සංරක්ෂණ හැකියාව පිළිබඳ නිරවුල් දැනුමක් ලබා ගැනීමට උපයෝගී කර ගත හැකි මූලාශ්‍රය වන්නේ,
(1) වංසකථා ය.
(2) පැරණි කාසි ය
(3) නටබුන් ය.
(4) සෙල්ලිපිය

(06) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් "ඉන්ඩිකා" නැමැති කෘතිය රචනා කරන ලද්දේ පහත කවුරුන් විසින් ද?
(1) ප්ලිනි
(2) මෙගස්තිනිස්
(3) ඇරිස්ටෝටල්
(4) ටොලමි

(36) සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස ශ්‍රී මහා බෝධිය රැගෙන පැමිණ බට ශ්‍රී ලංකාවේ පැරණි වරාය වන්නේ,

(1) මාතොට ය.
(2) ගෝකණ්ණය
(3) දඹකොළ පටුනය
(4) ලංකාපට්ටන ය.

(37) පරුමකවරුන්ගේ සහාය ලබාගෙන ශ්‍රී ලංකාව එක්සේසත් කළ රජතුමා පහත පිළිතුරු අතුරෙන් තෝරන්න.

(1) දුටුගැමුණු
(2) සද්ධාතිස්ස
(3) දේවානම්පියතිස්ස
(4) පණ්ඩුකාභය

(38) ජනතා විශ්වාසය දිනා ගනිමින් අවුරුදු හතලිස් හතරක් රජ කළ විදේශීය සම්භවයක් ඇති රජ කෙනෙකු වන්නේ,

(1) එළාර ය.
(2) නිශ්ශංකමල්ල ය.
(3) මහා පරාක්‍රමබාහු ය.
(4) පළමුවැන කාශ්‍යප ය.

(39) ශ්‍රී ලංකාවේ සංස්කෘතික නවෝදයක් ඇති කිරීමෙහිලා දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ සිදු වූ සිදුවීමක් නොවන්නේ,

(1) බුදු දහම් ගෙන ඒම
(2) රුවන්වැලි සෑය, මිරිසවැටිය වැනි ස්ථූප ඉදිකිරීම
(3) භික්ෂු - භික්ෂුණී ශාසනය පිහිටුවීම
(4) ශ්‍රී මහා බෝධිය රැගෙන ඒම

(40) ශ්‍රී ලංකාව බහුවාර්ගික, බහු ආගමික මෙන් ම විවිධ සංස්කෘතීන්ට අයත් රටක් වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,

(1) දූපතක් ලෙස පිහිටීම
(2) ස්වාභාවික සම්පත් බහුල රටක් වීම
(3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම
(4) අතීතයේ සිටම ඉතා දියුණු රටක් වීම